<u>**මොඩියුල ආකෘතිය**</u>

**1. මොඩියුලයේ නම**

**ආයතන සංගහයේ ගුරුවරයෙකුට අදාල මූලික කරුණු හා රාජ්‍ය සේවකයෙකු දැන ගත යුතු මූලික කරුණු හා මුදල් රෙගුලාසි වල සරල කරුණු.**

**2. අරමුණු**

අ) රාජ්‍ය නිලධාරියෙකු වශයෙන් ගුරුවරුන්ගේ නිල අයිතිවාසිකම්, යුතුකම්, වරප්‍රසාද සහ බැඳීම් පිළිබඳ අවබෝධයක් ලබා දීම.

ආ) ආයතන සංග්‍රහයේ ගුරුවරුන්ට අදාල වන විධිවිධාන පිළිබඳ අවබෝධයක් ලබා දීම

ඇ) ගුරුවරුන්ට ප්‍රයෝජනවත් වන මුදල් රෙගුලාසි වල විධිවිධාන පිළිබඳ සරල අවබෝධයක් ලබා දීම.

**3. අපේක්ෂිත ඵලය**

රාජ්‍ය නිලධාරියෙකු බැඳෙන පරිපාලන රෙගුලාසි සහ නීති රීති මෙන් ම මුදල් රෙගුලාසි පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම මගින් සහභාගිවන්නන්ගේ වෘත්තිය විනය සහතික කිරීමත්, එමගින් ඔවුන්ට වෘත්තිය ආරක්ෂාව සහතික කිරීමත් වේ.

**4. අන්තර්ගතය**

4.1 රාජ්‍ය නිලධාරියෙකු තමාගේ රාජකාරි අයිතිවාසිකම් සහ යුතුකම් ද, වරප්‍රසාද සහ බැඳීම් ද පිළිබඳ ප්‍රමානවත් අවබෝධයකින් කටයුතු කිරීමේ වැදගත්කම සුළු පටු නොවේ. ගුරුවරයා තම පරම වගකීම වන සිසු ප්‍රජාවට ශිල්ප ශාස්ත්‍ර ප්‍රගුණ කිරීම ප්‍රමුඛතාව ලෙස කටයුතු කිරීමේ දී තමා බැඳෙන පරිපාලන රෙගුලාසි, විනය රෙගුලාසි සහ මුදල් රෙගුලාසි අතපසු වී අසීරුතාවන්ට පත් වන අවස්ථා බහුල ය. එබැවින් රජයේ නිලධාරින් බැඳෙන රාජ්‍ය සේවා කොමිෂන් සභා රෙගුලාසි, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි සහ ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ ප්‍රතිපාදන අතුරෙන් පාඨමාලා කාලයේ සීමාවන් ඇතුලත ගුරුවරුන්ට එදිනෙදා අදාල වන සහ ප්‍රයෝජනවත් වන කරුණු මෙම මොඩියුලයට ඇතුලත් කොට ඇත.

මෙම මොඩියුලයේ පහත සඳහන් ක්ෂෙත්‍රයන් හැකි පමණ ආවරණය කෙරේ.

අ) ගුරු සේවයේ තනතුරු වලට බඳවා ගැනීම්, පත් කිරීම්, උසස් කිරීම් ආදිය ඇතුළු ප්‍රධාන පරිපාලන විධිවිධාන,

ආ) රජයේ නිලධාරියෙකු වශයෙන් ගුරුවරුන්ට බලපැවැත්වෙන විනය පටිපාටිය, සහ

ඇ) මූල්‍ය භාවිතයේ දී ගුරුවරුන් විසින් සැලකිල්ලට ගත යුතු උපචාරයන්.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග වල සහ ආයතන සංග්‍රහයේ හය වැනි පරිච්ඡේදයේ සිට අවසානය දක්වා පරිච්ඡේදත් මධ්‍යම රජය යටතේ වන ගුරුවරුන් සඳහා අදාල වන අතර, ආයතන සංග්‍රහයේ පළමුවැනි පරිච්ඡේදයේ සිට සියළු පරිච්ඡේද පලාත් රාජ්‍ය සේවය යටතේ වන ගුරුවරුන්ට අදාල වේ. සියළු රාජ්‍ය නිලධාරින් පොදුවේ බැඳෙන විනය පටිපාටිය අඩංගු ආයතන සංග්‍රහයේ දෙවැනි කොටසත්, මුදල් රෙගුලාසිත් ඉහත කී කාණ්ඩ දෙකට ම අයත් ගුරුවරුන්ට අදාල වේ.

## 4.2 අනුමාතෘකා

| අංකය | මාතෘකාව | අන්තර්ගතය | ගුණාත්මක යෙදවුම්/සම්පත් | ක්‍රමවේදය | කාලය |
|---|---|---|---|---|---|
| 1 | රාජ්‍ය සේවයේ ව්‍යුහය | • රාජ්‍ය සේවය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල ව විධායකයේ කොටසක් බව.<br>• ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව රාජ්‍ය සේවයේ තත්ත්වය<br>• මධ්‍යම රජයේ රාජ්‍ය සේවය<br>• පලාත් රාජ්‍ය සේවය | - සාකච්ඡා සඳහා පහසුකම්<br>- Flip Charts<br>- Power point presentations | - දේශන<br>- සාකච්ඡා | පැය එකයි |
| 2 | ගුරුවරයා සහ රාජ්‍ය සේවය | • ගුරුවරුන්ට බල පැවැත්වෙන ප්‍රධාන ව්‍යවස්ථාපිත විධිවිධාන<br>• ඒවා අතුරෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභා රෙගුලාසි, ආයතන සංග්‍රහය, පරිපාලන චක්‍රලේඛ සහ ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ ඇති බලපෑම<br>• රාජ්‍ය සේවකයා පිළිබඳ නිර්වචනය සහ ගුරුවරයා රාජ්‍ය සේවකයෙකු බව | - සාකච්ඡා සඳහා පහසුකම්<br>- Flip Charts<br>- Power point presentations | - දේශන<br>- සාකච්ඡා<br>- බුද්ධි කලම්බන -<br>- සිද්ධි අධ්‍යයන | පැය දෙකයි |
| 3 | ගුරු සේවයට බඳවා ගැනීම සහ පත්කිරීම් සිදු කිරීම | • ශ්‍රී ලංකා ගුරු ව්‍යවස්ථා සංග්‍රහය ප්‍රකාර ව ගුරු සේවයේ පන්ති සහ ශ්‍රේණි<br>• ගුරු සේවයට බඳවා ගැනීමේ දී සපුරා ලිය යුතු මූලික සුදුසුකම්, කොන්දේසි සහ අවශ්‍යතා:<br>• පොදුවේ අදාල වන ඒවා, සහ<br>ඒ ඒ පන්තියට/ශ්‍රේණියට අදාල වන ඒවා<br>• පත්වීමේ ලිපිය | - සාකච්ඡා සඳහා පහසුකම්<br>- Flip Charts<br>- Power point presentations | - දේශන<br>- සාකච්ඡා | පැය තුනයි |
| 4 | පෞද්ගලික ලිපිගොනුව | • පෞද්ගලික ලිපිගොනුවක වැදගත්කම, එය පවත්වා ගෙන යා යුතු අය, ඒ පිළිබඳ වගකීම.<br>• පෞද්ගලික ලිපිගොනුවක අන්තර්ගත කළ යුතු ලේඛණ | - සාකච්ඡා සඳහා පහසුකම්<br>- Flip Charts<br>- Power point presentations | - දේශන<br>- සාකච්ඡා | පැය එකයි |
| 5 | පරිවාස කාලය සහ සේවය ස්ථිර කිරීම | • පරිවාස කාලය සහ පරිවාස කාලය දීර්ඝ කිරීම පිළිබඳ රෙගුලාසි<br>• සේවය ස්ථිර කිරීමේ පටිපාටි සහ උපචාරයන් | - සාකච්ඡා සඳහා පහසුකම්<br>- Flip Charts<br>- Power point presentations | - දේශන<br>- සාකච්ඡා | පැය එකයි |
| 6 | වැටුප් වර්ධක | • වැටප් වර්ධක ලබා ගැනීමේ හිමිකම<br>• වැටුප් වර්ධක ප්‍රතික්ෂේප කිරීමේ ක්‍රම:<br>• තාවකාලික ව අත් හිටවීම<br>• නතර කිරීම<br>• අඩු කිරීම<br>• විලම්බනය කිරීම | - සාකච්ඡා සඳහා පහසුකම්<br>- Flip Charts<br>- Power point presentations | - දේශන<br>- සාකච්ඡා<br>- සිද්ධි අධ්‍යයන | පැය එකයි |

| | | | | | |
|---|---|---|---|---|---|
| 7 | නිවාඩු | • නිවාඩු අයිතිවාසිකමක් නොව වරප්‍රසාදයක් බව<br>• නිවාඩු හිමිකම්<br>• අනියම් නිවාඩු<br>• විවේක/අසනීප නිවාඩු<br>• රාජකාරි නිවාඩු<br>• කෙටි නිවාඩු<br>• හිලව් නිවාඩු සහ ඉකුත් නිවාඩු<br>• විශේෂ රෝග සඳහා වූ නිවාඩු<br>• අනතුරු නිවාඩු<br>• විදේශයන්හි ගත කරන නිවාඩු<br>• අඩ වැටුප් සහ වැටුප් රහිත නිවාඩු<br>• පාසැල් නිවාඩු කාලය<br>• ගුරුවරුන් සඳහා නිවාඩු මැයින් ආයතන සංග්‍රහයේ X11 පරිච්ඡේදයේ 24 වැනි ඡේදයේ දක්වා ඇති විශේෂ විධිවිධාන | - සාකච්ඡා සඳහා පහසුකම්<br>- Flip Charts<br>- Power point presentations | - දේශන<br>- සාකච්ඡා<br>- බුද්ධි කලම්බන<br>- සිද්ධි අධ්‍යයන | පැය එකයි |
| 8 | වෙනත් අයිතිවාසිකම් සහ සීමාවන් | • නිවාඩු දුම්රිය බලපත්‍ර සහ අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර<br>• වැටුප් ණය, වැටුප් අත්තිකාරම් සහ දේපල ණය<br>• දේශපාලන අයිතිවාසිකම්<br>• වෘත්තිය සමිති අයිතිවාසිකම්<br>• රාජකාරි ඉටු කිරීමේ දී හටගත් නඩු සම්බන්ධයෙන් පවත්නා සහනයන්<br>• වැන්දඹු සහ අනත්දරු අරමුදලේ සාමාජිකත්වය ලබා ගැනීමේ වැදගත්කම සහ ප්‍රතිලාභ<br>• ජූරි සභා වල සේවය කිරීම<br>• රජයේ නිලධාරින් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතල සහ පරිබාහිර සේවාවන් ඉටු කිරීම පිළිබඳ විධිවිධාන | - සාකච්ඡා සඳහා පහසුකම්<br>- Flip Charts<br>- Power point presentations | - දේශන<br>- සාකච්ඡා<br>- බුද්ධි කලම්බන<br>- සිද්ධි අධ්‍යයන<br>- භූමිකා රංගන | පැය දෙකයි |
| 9 | සේවය අවසන් කිරීම | • ඉල්ලා අස්වීම<br>• සේවය අත්හැර යාම<br>• විශ්‍රාම ගැන්වීම<br>• සේවයෙන් පහ කිරීම<br>• වෙනත් තනතුරකට මුදා හැරීම | - සාකච්ඡා සඳහා පහසුකම්<br>- Flip Charts<br>- Power point presentations | - දේශන<br>- සාකච්ඡා | පැය එකයි |
| 10 | ස්ථාන මාරු | • ජාතික පාසැල් අතර ස්ථාන මාරු<br>• පලාත් සභා ගුරුවරුන්ගේ ස්ථානමාරු<br>• මධ්‍යම රජයේ පාසැල් සහ පලාත් සභා පාසැල් අතර ගුරුවරුන් ස්ථාන මාරු සිදුකිරීම | - සාකච්ඡා සඳහා පහසුකම්<br>- Power point presentations | - දේශන<br>- සාකච්ඡා | පැය එකයි |

| | | | | | |
|---|---|---|---|---|---|
| 11 | විනය පාලනය | • ගුරුවරයෙකුගෙන් අපේක්ෂිත ගෞරවනීම හැසිරීම<br>• රජයේ නිලධාරියෙකු විසින් කරනු ලැබිය හැකි වැරදි<br>• මත්පැන් සහ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ වැරදි<br>• ළමා අපචාර සහ ලිංගික අපචාර චෝදනා<br>• දෙමාපියන් අනාචාරයට පෙළඹවීම පිළිබඳ චෝදනා<br>• ඔප්පු වූ චෝදනා වලට පැනවිය හැකි දඬුවම්<br>• මූලික පරීක්ෂණයක් පැවැත්වීම<br>• චෝදනා පත්‍ර නිකුත් කිරීම<br>• විනය පරීක්ෂණ පටිපාඩිය | | - දේශන<br>- සාකච්ඡා<br>- බුද්ධි කලම්බන<br>- සිද්ධි අධ්‍යයන<br>- භූමිකා රංගන | පැය දෙකයි |
| 12 | අත්‍යවශ්‍ය මුදල් රෙගුලාසි දැනුම | • මුදල් රෙගුලාසි පිළිපැදීමේ වැදගත්කම<br>• මුදල් ගෙවීමේ පිළිවෙල - බලය දීම, අනුමත කිරීම, සහතික කිරීම සහ ගෙවීම වෙන් වෙන් ව ක්‍රියාත්මක විය යුතු බව<br>• වවුචර පිළියෙල කිරීම<br>• අප්‍රමාද ව ගෙවීම් කිරීම<br>• පහසුකම් සහ සේවා ගාස්තු අය කිරීම, කුවිතාන්සි පොත් භාවිතය සහ මුදල් තැන්පත් කිරීම<br>• රජයේ මුදල් නොවන සහ වෙනත් මූලාශ්‍රයන්ගෙන් ලැබී පරිහරණය කරන මුදල් පිළිබඳ වගකීම | | - දේශන<br>- සාකච්ඡා<br>- බුද්ධි කලම්බන<br>- සිද්ධි අධ්‍යයන | පැය දෙකයි |

- **අමතර ක්‍රියාකාරකම්**
  - සාකච්ඡා
  - අද්දැකීම් හුවමාරු කර ගැනීම
  - රෙගුලාසි නොදැනීම නිසා තමා හෝ දන්නා වෙනත් ගුරුවරයෙකු මුහුණ දුන් දුෂ්කර අද්දැකීමක් පිළිබඳ විශ්ලේශන වාර්තාවක් ඉදිරපත් කිරීම

- **අමතර කියවීම්**
  - රජ්‍ය සේවා කොමිෂන් සභා රෙගුලාසි අඩංගු අංක: 1589/30 සහ 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය
  - ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය
  - ආයතන සංග්‍රහය
  - මුදල් රෙගුලාසි